**උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ සංවර්ධන ව්‍යාපෘතිය - 2019**

---

උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන බැංකුව හා ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය උදෙසා වන ජාත්‍යන්තර බැංකුව අතර 2017 ජුලි 17 දින එළඹි අංක 8743 එල්කේ දරන ණය ගිවිසුමේ හා අංක 6026 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 4.09(ආ) ව්‍යවස්ථා සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගෙ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය හා මූල්‍ය ගිවිසුම්වලට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර රජයේ විශ්වවිද්‍යාල 15 ක් සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික ආයතන සහ අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. (i) විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ වෛද්‍ය අංශවල ප්‍රමුඛ විෂයයන්ට රජයේ විශ්ව විද්‍යාලවලට, ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණික අධ්‍යාපන ආයතන, උසස් තාක්‍ෂණික ආයතන සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත් වීම වැඩිකිරීම (ii) උපාධි වැඩසටහන්වල ගුණත්වය වැඩි දියුණු කිරීම හා (iii) උසස් අධ්‍යාපන අංශයේ පර්යේෂණ හා නව සොයා ගැනීම් දිරිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය සහ මූල්‍ය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,136 කට සමාන එජඩො මිලියන 100 ක් වූ අතර ව්‍යාපෘතියේ මුළු පිරිවැය මූල්‍යනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සමායතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 මාර්තු 01 දින ආරම්භ කරන ලද අතර 2023 ජුනි 03 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශචය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි., තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දුස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මග හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නොපියවන ලද ශේෂ

| | විස්තරය | මුදල | නොපියවන ලද කාලය | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | ------------- | | ---------- | -------- | ------------ | ------------ |
| | | රු.මිලියන | | | | |
| **3.1.1** | **උපකරණ** | | | | | |
| අ - 1 | කැලණිය විශ්වවිද්‍යාලය | 7.0 | මාස 2 වැඩි | වෙනත් කටයුතු සඳහා අරමුදල් | අපේක්ෂිත ප්‍රසම්පාදනයන් | මුදල් රෙගුලාසි අනුගමනය කල යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ආ - 2 | ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 5.5 | මාස 6 වැඩි | යෙදවීමේ හැකියාව. ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ දී අපේක්ෂිත ප්‍රතිලාභ උපාධි අපේක්ෂකයන් වෙත නොලැබීම. | සම්පූර්ණ කර ඇත. අත්තිකාරමින් ඉතිරිය ආපසු යවා ඇත. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර විශ්වවිද්‍යාලවල කටයුතු පිළිබඳව නියාමන කටයුතු සිදුකළ යුතු ය. නියමිත කාලයේ දී නියමිත පිරිවැයට විශ්වවිද්‍යාලවල කටයුතු සිදුකිරීමේ දී අරමුදල් නාස්තිය වැලැක්වීමට අරමුදල් නිදහස් කිරීමට පෙර කටයුතු සඳහා වැයවෙන නිවැරදි මුදල ඇස්තමේන්තු කල යුතුය. |
| ඇ - 3 | විවෘත විශ්වවිද්‍යාලය | 5 | මාස 11 වැඩි | | | |
| ඈ - 4 | අග්නිදිග විශ්වවිද්‍යාලය | 5.8 | මාස 4 ½ වැඩි | | | |
| ඉ - 5 | රුහුණු විශ්වවිද්‍යාලය | 22.2 | මාස 4 වැඩි | | | |
| ඊ - 6 | මොරටුව විශ්වවිද්‍යාලය | 28.3 | මාස 3 ½ වැඩි | | | |
| උ - 7 | යාපනය විශ්වවිද්‍යාලය | 14.6 | මාස 2 වැඩි | | | |
| ඌ - 8 | වයඹ විශ්වවිද්‍යාලය | 15.1 | මාස 6 වැඩි | | | |
| එ - 9 | සබරගමුව විශ්වවිද්‍යාලය | 9.3 | මාස 7 ½ වැඩි | | | |

**පර්යේෂණ හා නවෝත්පාදන**

**3.1.2 වාණිජකරණය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඒ 10 | ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 24.5 | මාස 5 ½ වැඩි | වෙනත් කටයුතු සඳහා අරමුදල් යෙදවීමේ හැකියාව. මෙය ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල සඳහා බලපානු ලැබේ. | සියළුම සැලසුම් කල කටයුතු සිදුකරමින් පවතී. | මුදල් රෙගුලාසි අනුගමනය කල යුතුය. කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර විශ්වවිද්‍යාලවල කටයුතු පිළිබඳව නියාමන කටයුතු සිදුකළ යුතු ය. නියමිත කාලයේ දී නියමිත පිරිවැයට විශ්වවිද්‍යාලවල කටයුතු සිදුකිරීමේ දී අරමුදල් නාස්තිය වැලැක්වීම අරමුදල් නිදහස් කිරීමට පෙර කටයුතු සඳහා වැයවෙන නිවැරදි මුදල ඇස්තමේන්තු කල යුතුය. |
| ඔ 11 | විවෘත විශ්වවිද්‍යාලය | 19.8 | මාස 5 ½ වැඩි | | | |
| ඕ 12 | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 20.6 | මාස 8 ½ වැඩි | | | |
| ක 13 | මොරටුව විශ්වවිද්‍යාලය | 5.0 | මාස 6 ½ වැඩි | | | |
| ග 14 | සබරගමුව විශ්වවිද්‍යාලය | 2.9 | මාස 7 ½ වැඩි | | | |

**3.1.3 විශ්වවිද්‍යාවල ව්‍යාපාර සම්බන්ධතා ඒකක සංවර්ධනය කිරිම (UBL Cell)**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (අ) | කැලණිය විශ්වවිද්‍යාලය | 1 | මාස 2 ½ වැඩි | වෙනත් කටයුතු සඳහා අරමුදල් යෙදවීමේ හැකියාව. මෙය ව්‍යාපෘතියේ | ව්‍යාපෘති ආරම්භයේ දී ප්‍රගතිය මන්දගාමී විය. කෙසේ වෙතත්, වර්තමානයේ | මුදල් රෙගුලාසි අනුගමනය කල යුතුය. කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර විශ්වවිද්‍යාලවල කටයුතු පිළිබඳව |
| (ආ) | ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 2.3 | මාස 6 ½ වැඩි | | | |
| (ඇ) | විවෘත විශ්වවිද්‍යාලය | 1.5 | මාස 6 ½ | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | වැඩි | අපේක්ෂිත ප්‍රතිඵල සඳහා බලපානු ලැබේ. | පූර්ණකාලීන කළමනාකරුවකු පත්කර ඇති අතර ඒකක සතුටුදායක ලෙස ක්‍රියාත්මක වේ. | නියාමන කටයුතු සිදුකළ යුතු ය. නියමිත කාලයේ දී නියමිත පිරිවැයට විශ්වවිද්‍යාලවල කටයුතු සිදුකිරීමේ දී අරමුදල් නාස්තිය වැලැක්වීම අරමුදල් නිදහස් කිරීමට පෙර කටයුතු සඳහා වැයවෙන නිවැරදි මුදල ඇස්තමේන්තු කල යුතුය. |
| (ඈ) | අග්නිදිග විශ්වවිද්‍යාලය | 1.1 | මාස 12 වැඩි | | | |
| (ඉ) | රුහුණු විශ්වවිද්‍යාලය | 3.4 | මාස 6 ½ වැඩි | | | |
| (ඊ) | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 1.3 | මාස 3 ½ වැඩි | | | |
| (උ) | සබරගමුව විශ්වවිද්‍යාලය | 1.1 | මාස 2 වැඩි | | | |

**නවෝත්පාදන වාණිජකරණය කිරීම වැඩිදියුණු කිරීම**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (අ) | ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 10.5 | මාස 12 වැඩි | වෙනත් කටයුතු සඳහා අරමුදල් යෙදවීමේ හැකියාව. මෙය ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල සඳහා බලපානු ලැබේ. | 2018 වර්ෂයේ දී ව්‍යාපෘතිය ආරම්භයේ දී ප්‍රසම්පාදනයන් සහ අනෙකුත් කටයුතු කඩිනම් කිරීමට අරමුදල් නිදහස් කර ඇත. කෙසේවෙතත්, ව්‍යාපෘතිය මුල් අදියරේ දී ප්‍රගතිය මන්දගාමී විය. සියළුම සැලසුම් කල කටයුතු සතුටුදායක ලෙස වර්තමානයේ සිදුකරමින් පවතී. | මුදල් රෙගුලාසි අනුගමනය කල යුතුය. කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර විශ්වවිද්‍යාලවල කටයුතු පිළිබඳව නියාමන කටයුතු සිදුකළ යුතු ය. නියමිත කාලයේ දී නියමිත පිරිවැයට විශ්වවිද්‍යාලවල කටයුතු සිදුකිරීමේ දී අරමුදල් නාස්තිය වැලැක්වීම අරමුදල් නිදහස් කිරීමට පෙර කටයුතු සඳහා වැයවෙන නිවැරදි මුදල ඇස්තමේන්තු කල යුතුය. |
| (ආ) | රුහුණු විශ්වවිද්‍යාලය | 6.4 | මාස 7 ½ වැඩි | | | |
| (ඇ) | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 9.5 | මාස 6 ½ වැඩි | | | |
| (ඈ) | වයඹ විශ්වවිද්‍යාලය | 5.0 | මාස 6 ½ වැඩි | | | |
| (ඉ) | කොළඹ විශ්වවිද්‍යාලය | 21.3 | මාස 7 ½ වැඩි | | | |

**3.3 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්**

| | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | ---------------- | ------------- | ------------------ | ------------------- | ------------------- |
| (අ) | 2002 පෙබරවාරි 28 දිනැති අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | UCSC විසින් පරිගණක උපාංග හා මෘදුකාංග ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. | * වත්කම්වල පැවැත්ම සත්‍යාපනය කළ නොහැක.<br>* වෙනත් අරමුණු සඳහා යොදා ගැනීමේ හැකියාව | ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කිරීමට සියළුම OTS නිලධාරීන් දැනුවත් කර ඇති අතර ආකෘතියක් පවා හඳුන්වා දී ඇත. ඒ අනුව ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කරන | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල විය යුතු ය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | * අවභාවිතය සහ හානිවීම් සඳහා ඉඩ ඇත. | බව UCSC අපව දැනුවත් කර ඇත. | |
| | | කැළණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය විසින් පරිගණක උපාංග හා මෘදුකාංග ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. | * වත්කම්වල පැවැත්ම සත්‍යාපනය කළ නොහැක.<br>* වෙනත් අරමුණු සඳහා යොදා ගැනීමේ හැකියාව<br>* අවභාවිතය සහ හානිවීම් සඳහා ඉඩ ඇත. | AHEAD අරමුදල් යටතේ මිලදී ගන්නා ලද සියළුම වත්කම් සඳහා OTS වල ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කරනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල විය යුතු ය. |
| (ආ) | 2009 සැප්තැම්බර් 01 දිනැති අංක ඕඑම්ඒ/2009/2 දරන කළමනාකරණ චක්‍රලේඛය | කැළණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය විසින් වත්කම් පිළිබඳ වාර්තා පවත්වා ගැනීම මෙම චක්‍රලේඛයට අනුකූල නොවීය. | * වෙනත් අරමුණු සඳහා යොදා ගැනීමේ හැකියාව<br>* වෙනත් අරමුණු සඳහා යොදා ගැනීමේ හැකියාව<br>* අවභාවිතය සහ හානිවීම් සඳහා ඉඩ ඇත. | AHEAD අරමුදල් යටතේ මිලදී ගන්නා ලද සියළුම වත්කම් සඳහා OTS වල ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කරනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතු ය. |

## 4. භෞතික කාර්යසාධනය

### 4.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

ව්‍යාපෘති සංරචකය සහ වැඩසටහන් සංරචකය යනා දී සංරචක 2ක් යටතේ උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතියේ මෙහෙයුම් සිදුකරනු ලැබේ.
වැඩසටහන් සංරචකය ප්‍රතිඵල කලාප 3 ක් සහ වියපැහැදම් සම්බන්ධ දර්ශක 6 ක් යටතේ මෙහෙයවනු ලැබේ. විස්තර පහත දැක්වේ.

**වැඩසටහන් සංරචකය**

ප්‍රතිඵල කලාප 1 - ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රමුඛතා විෂයයන් සඳහා උසස් අධ්‍යාපනයට ඇතුලත් වීම වැඩි කිරීම.

ප්‍රතිඵල කලාප 2 - උසස් අධ්‍යාපනයේ ගුණත්වය වැඩි කිරීම.

ප්‍රතිඵල කලාප 3 - පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම

**ව්‍යාපෘති සංරචකය-** මෙහෙයුම් සහ නියාමන සහය

| | සංරචකය | 2019 දෙසැම්බර් 31 දිනට | | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | අත්කර ගත් කාර්යසාධනය | | | |
| **(අ)** | **ප්‍රතිඵල කලාප 1** | | | | | |
| (i) | වි.පැ.ද. 1: උසස් අධ්‍යාපන ආයතනවල විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ ගණිත අංශවල උපාධි අපේක්ෂකයින් බඳවා ගැනීම් වැඩිකිරීම. | අධ්‍යයන වර්ෂ 2019 දී විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු, වෛද්‍ය උපාධි වැඩසටහන්වලට නව බඳවා ගැනීම් 17,500 | රාජ්‍ය විශ්වවිද්‍යාවල 2019 වර්ෂය සඳහා බඳවා ගැනීමේ දත්ත යාවත්කාලීන කර නොතිබුණි. | ඇල්ම ඇති පාර්ශවයන් වෙත අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දැනටමත් දත්ත නොමැත. මෙය යාවත්කාලීන කිරීමට ව්‍යාපෘතියට නොහැකි මට්ටමක පවතී. | අවශ්‍ය තොරතුරු ලබාගැනීමට ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු ය. |
| (ii) | වි.පැ.ද 5 | විශ්ව විද්‍යාලවල, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල සහ ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණික අධ්‍යාපන ආයතනවල කාර්ය මණ්ඩලයේ PHD උපාධි, ශාස්ත්‍රපති උපාධි සහ වෘත්තීය ආචාර්ය උපාධි සම්පූර්ණ කිරීම. | ඉලක්කය ශිෂ්‍යත්ව 200ක් වුවද 2019.12.31 දිනට ශිෂ්‍යත්ව 112ක් පමණක් ප්‍රදානය කර ඇත. | ව්‍යාපෘතියේ ඉලක්ක අත්කර ගැනීම් සහ ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ඇල්ම ඇති පාර්ශවයන් වෙත ළඟාවීම පිළිබඳ සැක පවතී. | ව්‍යාපෘතිය 2020 ජුනි 30 දිනට ශිෂ්‍යත්ව 181 ක් ප්‍රදානය කර තිබුණු අතර මෙම වර්ෂය තුළදී ඉලක්ක අත්කර ගැනීමට අපේක්ෂිතය. | සැලසුම් කාලය තුළ දී ව්‍යාපෘතියේ උප කටයුතු සම්පූර්ණ කිරීමට සහ වෙන්කල අරමුදල් සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමට අවශ්‍ය වේ. |

**4.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුල දී උපදේශන කටයුතු පිළිබඳ රු.මිලියන 29.5ක් වටිනා කොන්ත්‍රාත් | මෙය ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල සහ නිමවුමට බලපානු ලැබේ. | ආරම්භක PP පිළියෙල කිරීමේ අදියරේදී අදාළ නිලධාරීන්ගේ ඉල්ලීම මත මෙම උපදේශන කොන්ත්‍රාත්තු PP ඇතුළත් කර තිබුණි. කෙසේවෙතත්, තවදුරටත් අවශ්‍ය නොවන බව | ව්‍යාපෘතියේ කටයුතු කාර්යක්ෂමව සැලසුම් කිරීම සහ නිර්මාණය කිරීම කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | 5ක් අවලංගු කර තිබුණි. | | පසුව හඳුනාගත් අතර ලෝක බැංකුවේ අනුමැතිය සහිතව අවලංගු කරන ලදී. | |

**4.3 වැඩබිම් පරීක්ෂාවේ දී සිදුකරන ලද නිරීක්ෂණ**

| | විගණන ගැටළු | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | --------------- | ------ | -------------- | ---------------- |
| (අ) | • සමාලෝචිත වර්ෂය තුල දී කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය විසින් මිලදී ගන්නා ලද රු.මිලියන 1 වටිනා Universal Occupancy Therapy Table හා ශබ්ද පද්ධතිය සහ විද්‍යා පීඨය විසින් මිලදී ගන්නා ලද රු.මිලියන 14.3ක් වටිනා උපකරණ විගණිත දිනය වූ 2020 පෙබරවාරි 25 තෙක් උපයෝජනය කර නොතිබුණි.<br><br>• කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසල සඳහා මිලදී ගත් රු.මිලියන 20 වටිනා ලැප්ටොප් 90 සහ ලොකර් 05ක් වර්ෂයකට වැඩි කාලයක් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි. | උපාධි අපේක්ෂකයින්ට උපකරණ අපේක්ෂිත අරමුණු සඳහා යොදාගැනීමට නොහැකි වේ. | මෙම අයිතමයන් දැන් භාවිතා වේ. මෙය සංරචක 1හි විගණන වාර්තාවට අපගේ පිළිතුරෙහි පැහැදිලි කර ඇත. | ව්‍යාපෘති අරමුදල් යටතේ මිලදී ගන්නා ලද අයිතමයන් සහ උපකරණ භාවිතය පිළිබඳ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය සහතික කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය සඳහා AHEAD ප්‍රදාන යටතේ මිලදී ගන්නා ලද රු.මිලියන 14.3 වටිනා අයිතමයන් විගණිත දිනය වූ 2020 පෙබරවාරි 25 දින වන විටත් කේතනය කර නොතිබුණි. | අයිතමයන් හඳුනාගැනීමට නොහැකි අතර මේවා අස්ථානගත වීම සහ අවභාවිතය වීම සිදුවිය හැක. | සෑම අයිතමයකම තොග යොමු අංකය අලවා ඇත. AHEAD මඟින් ලබාදෙන ස්ටිකරය නුදුරු අනාගතයේ දී සෑම උපකරණයකම ඇලවීම සිදු කෙරේ. | ව්‍යාපෘති අරමුදල් යටතේ මිලදී ගන්නා ලද සෑම අයිතමයකම තොග යොමු අංකය ඇලවිය යුතුය. |

**4.4 ඌන උපයෝජිත සම්පත්**

| | විගණන ගැටළු | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ---------- | ---------- | --------------- | ----------------- |
| (අ) | ව්‍යාපෘතිය රජයේ විශ්වවිද්‍යාල 13 ව්‍යාපාර සම්බන්ධතා ඒකක ස්ථාපනය කිරීමට පියවර ගෙන තිබුණු අතර 2019 වර්ෂය තුලදී රු.මිලියන 32.8 ක අත්තිකාරම් | ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය පිළිබඳ දුර්වල පාලනයන් වන අතර එය ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලවලට | 2019 ව්‍යාපාර සම්බන්ධතා ඒකකවල කටයුතු ක්‍රියාත්මක කිරීමේ පළමුවන වර්ෂය වේ. අරමුදල්වලින් | විශ්වවිද්‍යාල විසින් ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් කිරීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | මුදලක් ප්‍රදානය කර තිබුණි. කෙසේවෙතත්, සියයට 70ක් නියෝජනය වන එකතුව රු.මිලියන 22.9ක් වැය කර තිබුණි. | බලපානු ලැබේ. | සියයට 70 වැඩියෙන් උපයෝජනය හොඳ ප්‍රගතියක් වේ. AHEAD UBL ලකුණු කාඩ්පතෙහි 2 කොටසේ සියළුම UBls සම්පූර්ණ කර ඇත. | |
| (ආ) | කැලණිය විශ්වවිද්‍යාලය විසින් ව්‍යාපාර සම්බන්ධතා ඒකක මත රු.මිලියන 1ක අත්තිකාරම් මුදලන් සියයට 21.3ක් පමණක් වියදම් කර තිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය පිළිබඳ දූර්වල පාලනයන් වන අතර එය ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලවලට බලපානු ලැබේ. | UBL 2019 අගෝස්තු ස්ථාපනය කර තිබුණු අතර රු.මිලියන 01 අත්තිකාරම් මුදල 2019 සැප්තැම්බර් මුදා හැර තිබුණි. ප්‍රමාද වී ආරම්භ කිරීම හේතුවෙන් ප්‍රගතියට අඩු මට්ටමක පවතී. | තවදුරටත් ප්‍රමද වීමට ඉඩදීමකින් තොරව විශ්වවිද්යාල විසින් ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් කිරීම අවශ්‍ය වේ. |
| (ඇ) | 2019 වර්ෂය තුල දී රජරට විශ්වවිද්‍යාලයට ව්‍යාපාර සම්බන්ධතා ඒකක සඳහා රු.මිලියන 4.2 ක මුදලක් අත්තිකාරම් ලෙස ප්‍රදානය කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය තෙක් විශ්වවිද්‍යාල විසින් සියයට 27.49ක් නියෝජනය වන එකතුව රු.මිලියන 1.1ක් පමණක් වැය කර තිබුණි. | ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය පිළිබඳ දූර්වල පාලනයන් වන අතර එය ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලවලට බලපානු ලැබේ. | රු.මිලියන 4.2න් රු.මිලියන 2.5ක් 2019 නොවැම්බර් සහ දෙසැම්බර් නිදහස් කර තිබුණි. ඒකක සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වූ පසු ප්‍රගතිය වැඩි වේ. | තවදුරටත් ප්‍රමද වීමට ඉඩදීමකින් තොරව විශ්වවිද්‍යාල විසින් ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් කිරීම අවශ්‍ය වේ. |
| (ඈ) | ව්‍යාපෘතිය පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත RIC සඳහා 2019 තුල දී රු.මිලියන 32 මුදලක් ප්‍රදානය වැඩි කිරීමට පියවර ගෙන තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට විශ්වවිද්‍යාලය විසින් සියයට 45ක් නියෝජනය කරන එකතුව රු.මිලියන 14.3ක් පමණක් අපේක්ෂිත අරමුණු සඳහා වැය කර තිබුණි. | ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය පිළිබඳ දූර්වල පාලනයන් වන අතර එය ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලවලට බලපානු ලැබේ. | මෙය විගණන වාර්තාවට අපගේ අදහස් දැක්වීමේ දී පැහැදිලි කර ඇත. පැහැදිලි කල පරිදි රු.මිලියන 14.30ක උපයෝජනය ශුද්ධ අත්තිකාරම වූ රු.මිලියන 17.57 සමඟ සන්සන්දනය කල යුතු ය. එම නිසා RIC උපයෝජනය සියයට 81 වේ. | තවදුරටත් ප්‍රමද වීමට ඉඩදීමකින් තොරව විශ්වවිද්‍යාල විසින් ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් කිරීම අවශ්‍ය වේ. |
| (ඉ) | ව්‍යාපෘතිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ICE වැඩසටහන සඳහා 2019 වර්ෂය තුලදී රු.මිලියන 21ක ප්‍රදානයක් ලබාදීමට පියවර ගෙන තිබුණි. | ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය පිළිබඳ දූර්වල පාලනයන් වන අතර එය ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලවලට | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට ව්‍යාපෘතිය ආරම්භයේ දී අත්තිකාරම් මුදල නිදහස් කර තිබුණි. | තවදුරටත් ප්‍රමද වීමට ඉඩදීමකින් තොරව විශ්වවිද්‍යාල විසින් ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳව |

| | | | | |
|---|---|---|---|---|
| | කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට අපේක්ෂිත අරමුණ සඳහා සියයට 49.6 ක් නියෝජනය කරන එකතුව රු.මිලියන 10.4 ක් පමණක් වැය කර තිබුණි. | බලපානු ලැබේ. | ව්‍යාපෘතියේ මුල් අදියරේ දී ප්‍රගතිය සාපේක්ෂව අඩු මට්ටමක පැවතුණි. | සමීප අධීක්ෂණයක් කිරීම අවශ්‍ය වේ. |
| (ඊ) | ව්‍යාපෘතිය ශ්‍රී ජයවර්ධනපුර හා පේරාදෙණිය විශ්වවිද්‍යාලවල DOR වැඩසටහන් සඳහා 2019 වර්ෂය තුල දී රු.මිලියන 7.5 සහ රු.මිලියන 9.2 ක් ප්‍රදානය කිරීමට පියවර ගෙන තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට සියයට 42.7 ක් වූ එකතුව රු.මිලියන 3.2ක් සහ සියයට 44.5ක් වූ එකතුව රු.මිලියන 4ක් පමණක් වැයකර තිබුණි. | ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය පිළිබඳ දුර්වල පාලනයන් වන අතර එය ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලවලට බලපානු ලැබේ. | රු.මිලියන 7.5 න් රු.මිලියන 4.5ක් 2019/12/30 දින නිදහස් කර ඇත. එම නිසා, ඉතිරි රු.මිලියන 3 සමඟ සැසඳීම සිදු කළ යුතු ය. එම නිසා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ප්‍රගතිය 100%ක් වන අතර DOR වැඩසටහන් දෙවතාවක් සිදුකර මුළු අත්තිකාරම් රු.මිලියන 19.50ක් නිදහස් කර තිබුණු අතර රු.මිලියන 17.27ක් උපයෝජනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රගතිය සියයට 89 වේ. | තවදුරටත් ප්‍රමද වීමට ඉඩදීමකින් තොරව විශ්වවිද්‍යාල විසින් ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් කිරීම අවශ්‍ය වේ. |
| (උ) | ව්‍යාපෘතිය මොරටුව විශ්වවිද්‍යාලයේ DOR වැඩසටහන් සඳහා 2019 වර්ෂය තුල දී රු.මිලියන 6.5 ක් ප්‍රදානය කිරීමට පියවර ගෙන තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට සියයට 16 ක් වූ එකතුව රු.මිලියන 1 ක් පමණක් වැයකර තිබුණි. | ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය පිළිබඳ දුර්වල පාලනයන් වන අතර එය ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලවලට බලපානු ලැබේ. | විශ්ව විද්‍යාල සඳහා DOR වැඩසටහනේ වට දෙකක් ඇති අතර නිදහස් කල මුළු අත්තිකාරම රු. මිලියන 9.50 ක් වන අතර උපයෝජනය රු. මිලියන 8.71 වන අතර මූල්‍ය ප්‍රගතිය 91% වේ. | තවදුරටත් ප්‍රමද වීමට ඉඩදීමකින් තොරව විශ්වවිද්‍යාල විසින් ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් කිරීම අවශ්‍ය වේ. |
| (ඌ) | ව්‍යාපෘතිය කැළණිය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලවල ELTA/ELSE වැඩසටහන් සඳහා 2019 වර්ෂය තුල දී රු.මිලියන 1.5 සහ රු.මිලියන 3.75 ක් ප්‍රදානය කිරීමට පියවර ගෙන තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය | ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය පිළිබඳ දුර්වල පාලනයන් වන අතර එය ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලවලට බලපානු ලැබේ. | 2019 නොවැම්බර් සහ දෙසැම්බර් මාස තුළදී අත්තිකාරම් නිදහස් කිරීම නිසා 2019 අවසානය වන විට කටයුතු ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණි. | තවදුරටත් ප්‍රමද වීමට ඉඩදීමකින් තොරව විශ්වවිද්‍යාල විසින් ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් කිරීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | වන විට 8.19% ක් වූ එකතුව රු.මිලියන 0.1 ක් සහ 9.7 ක් වූ එකතුව රු.මිලියන 0.36 ක් පමණක් වැයකර තිබුණි. | | | |
| (එ) | ව්‍යාපෘතිය නැගෙනහිර සහ ඌව විශ්වවිද්‍යාලවල පීඨ සහ දෙපාර්තමේන්තු වලට ELTA/ELSE වැඩසටහන් සඳහා 2019 වර්ෂය තුළදී රු.මිලියන 1සහ රු.මිලියන 2 සහ රු. මිලියන 0.3 ක් ප්‍රදානය කර තිබුණි. කෙසේවෙතත් සමාලෝචිත වර්ෂය අවසානය වන විට නැගෙනහිර සහ ඌව විශ්වවිද්‍යාලවල පීඨ සහ දෙපාර්තමේන්තු විසින් අපේක්ෂිත අරමුණු සඳහා 27.75 % සහ 42.52% ක් වූ එකතුව රු.මිලියන 0.1 ක් සහ රු.මිලියන 0.2 ක් පමණක් වැයකර තිබුණි. | ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය පිළිබඳ දුර්වල පාලනයන් වන අතර එය ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලවලට බලපානු ලැබේ. | 2019 ඔක්තෝබර් සහ දෙසැම්බර් මාස තුළදී අත්තිකාරම් නිදහස් කිරීම නිසා 2019 අවසානය වන විට කටයුතු ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණි. | තවදුරටත් ප්‍රමද වීමට ඉඩදීමකින් තොරව විශ්වවිද්‍යාල විසින් ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් කිරීම අවශ්‍ය වේ. |
| (ඒ) | ව්‍යාපෘතිය කොළඹ විශ්ව විද්‍යාලයේ ELTA/ELSE වැඩසටහන් සඳහා 2019 වර්ෂය තුළදී රු.මිලියන 4 ක් ප්‍රදානය කිරීමට පියවරගෙන තිබුණි. කෙසේවෙතත් සමාලෝචිත වර්ෂය අවසානය වන විට අපේක්ෂිත අරමුණු සඳහා 11.51 % ක් වූ එකතුව රු.මිලියන 0.5 ක් පමණක් වැයකර තිබුණි. | ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය පිළිබඳ දුර්වල පාලනයන් වන අතර එය ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලවලට බලපානු ලැබේ. | 2019 දෙසැම්බර් 24 දින අත්තිකාරම් නිදහස් කර තිබුණු අතර නිසා 2019 අවසානය වන විට කටයුතු ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණි. | තවදුරටත් ප්‍රමද වීමට ඉඩදීමකින් තොරව විශ්වවිද්‍යාල විසින් ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් කිරීම අවශ්‍ය වේ |

### 4.5 මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටළු

| | කාර්ය මණ්ඩල තනතුරු | තනතුරු ගණන | | | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|
| | | අනුමත | 2019 දෙසැම්බර් 31 දිනට තත්‍ය | පුරප්පාඩු/ අතිරික්ත | | | |
| (අ) | බඳවාගැනීම් සහ පද්ධති | 01 | - | 01 | ව්‍යාපෘතියේ කාර්යසාධනය | විශ්වවිද්‍යාල වලින් බඳවාගැනීම් පිළිබඳ දත්ත | ව්‍යාපෘතියේ කටයුතුවල සුමට |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | සව්බලගැන්වීමේ ව්‍යාපෘති නිලධාරී | | | | සඳහා බලපානු ලැබේ. | එකතු කිරීම ව්‍යාපෘති නිලධාරියාගේ කාර්යභාරය වූ අතර එවැනි දත්ත ලබාගැනීම සඳහා ණය නියෝජිත ආයතනය අවශ්‍යතා සපුරාලීමට ආරම්භක අදියරේ දී මෙම තනතුර නිර්මාණය කර ඇත. කෙසේවෙතත්, අවශ්‍ය බඳවා ගැනීම් පිළිබඳ දත්ත සෘජුවම UGC මගින් ලබාගෙන AHEAD ව්‍යාපෘතියට ලබා දී ඇත. එම නිසා සේවය අවශ්‍ය අවස්ථාවේ දී මෙම නිලධාරියා බඳවා ගැනීම අවශ්‍ය නොවුණි. | ක්‍රියාකාරීත්වය තහවුරු කිරීමට අනුමත කාර්ය මණ්ඩලය අනුව පුරප්පාඩු තනතුරු පිරවිය යුතුය. |
| (ආ) | ව්‍යාපෘති ලේකම් | 01 | - | 01 | පුරප්පාඩු පිරවීමට පියවර නොගැනීම හේතුවෙන් ව්‍යාපෘතියේ කාර්යසාධනයට බලපෑම් ඇති වේ. | බඳවාගත් ව්‍යාපෘති ලේකම් 2019.06.24 දින සේවයෙන් ඉවත් වී ඇත. ආරම්භක අවස්ථාවේ දී මෙම තනතුරට සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කිරීමට සිදුවිය. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම නිසා අර්ධකාලීනව කටයුතු කරන ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ UGC හිටපු උප සභාපති ශ්‍රේෂ්ඨ පරිපාලන නිලධාරී සමඟ සම්බන්ධීකරණය කිරීමට සිදුවිය. එම නිසා ව්‍යාපෘති ලේකම්ගේ සේවයෙන් ඉවත්වීම මගින් ලොකු රික්තකයක් නිර්මාණය නොවුණි. ව්‍යාපෘතිය මෙම තනතුර අවශ්‍යතාවයක් ඇති වූ විට පුරවනු ලැබේ. | ව්‍යාපෘතියේ කටයුතුවල සුමට ක්‍රියාකාරීත්වය තහවුරු කිරීමට අනුමත කාර්ය මණ්ඩලය අනුව පුරප්පාඩු තනතුරු පිරවිය යුතු ය. |
| (ඇ) | ප්‍රසම්පාදන නිලධාරී | 01 | - | 01 | පුරප්පාඩු පිරවීමට පියවර නොගැනීම හේතුවෙන් ව්‍යාපෘතියේ | බඳවාගත් ප්‍රසම්පාදන නිලධාරියා 2019/10/24 දින සේවයෙන් ඉවත් වී ඇත. මෙම තනතුර 2019 සැප්තැම්බර් ප්‍රචාරණය | ව්‍යාපෘතියේ කටයුතුවල සුමට ක්‍රියාකාරීත්වය තහවුරු කිරීමට අනුමත කාර්ය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | කාර්යසාධනයට බලපෑම් ඇති වේ. | කරන ලද අතර අයදුම්පත්‍ර ලැබුණි. කෙසේවෙතත්, මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත බඳවා ගැනීම් නතර කරන ලද 2019.09.18 දිනැති ඊසී/ඊඩීආර්/පීආර්ඊ-2019 සහ 2019/11/20 දිනැති ඩීඑම්එස්/ප්‍රතිපත්ති/ බඳවාගැනීම් දරන චක්‍රලේඛ හේතුවෙන් බඳවාගැනීම් ක්‍රියාවලිය සිදුකිරීමට නොහැකි විය. පුරප්පාඩුව පිරවීමට භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් විශේෂ අනුමැතියක් ලබාගැනීමට අමාත්‍යාංශය ඉල්ලීමක් කර ඇත. ඒ සඳහා අනුමැතිය 2020/02/25 දින ලැබුණි. සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. නමුත් සුදුසු පුද්ගලයෙකු බඳවා ගැනීමට නොහැකි වූ අතර වර්තමානයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ මැතිවරණ කොමිෂමේ නැවත ප්‍රචාරය කිරීමට අනුමැතිය ඉල්ලා ඇත. | මණ්ඩලය අනුව පුරප්පාඩු තනතුරු පිරවිය යුතු ය. |
| (ඇ) | කළමනාකරණ සහකාර | 08 | 02 | 06 | පුරප්පාඩු පිරවීමට පියවර නොගැනීම හේතුවෙන් ව්‍යාපෘතියේ කාර්යසාධනයට බලපෑම් ඇති වේ. | 2018 ජූලි කළමනාකරණ සහකරුවන් බඳවා ගැනීමට පියවර ගෙන තිබුණි. සම්මුඛ පරීක්ෂණ 2018 සැප්තැම්බර් පවත්වන ලද අතර අයදුම්කරුවන් 6 දෙනෙකු තෝරාගෙන ඇත. කෙසේවෙතත්, 4 දෙනෙකු වාර්තා කර ඇති අතර දෙදෙනෙකු පසුව ඉවත් වී ඇත. පසුව 2019/9/18 දිනැති ඊසී/ඊඩීආර්/පීආර්ඊ-2019 සහ 2019/11/20 දිනැති | ව්‍යාපෘතියේ කටයුතුවල සුමට ක්‍රියාකාරීත්වය තහවුරු කිරීමට අනුමත කාර්ය මණ්ඩලය අනුව පුරප්පාඩු තනතුරු පිරවිය යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | | ඩීඑම්සී/ප්‍රතිපත්ති/ බඳවාගැනීම් චක්‍රලේඛ මඟින් සියළුම බඳවා ගැනීම් තාවකාලිකව නතර කරන ලදී. මෙම තහනම ඉවත් කිරීමෙන් පසු අවශ්‍ය පියවර ගනු ලැබේ. |

**4.6 පද්ධති සහ පාලනයන්**

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| --------------- | ---------- | --------------- | ------------------- |
| අවශ්‍යතා විශ්ලේෂණය කිරීමකින් තොරව විශ්වවිද්‍යාලවලට අත්තිකාරම් ලබාදී තිබුණි. | අනෙකුත් අරමුණුවලට සඳහා භාවිතා කිරීමට හැකි අතිරික්ත මුදලක් විශ්වවිද්‍යාලවල පවතී. | ව්‍යාපෘතිය ආරම්භයේදී ප්‍රසම්පාදනයන් කඩිනම් කිරීමට OTS වෙත අත්තිකාරම් නිදහස් කර තිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු නිසි පරිදි සැලසුම් කල යුතුය. |